එළිදරව් පොතෙන් හෙළිදරව් වන

# යේසුස්වහන්සේගේ මහිමය



නෙවිල් ජයසුන්දර

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ වර්ථමාන තේජස ඇදහිල්ලේ නෙතින් දැකීමෙන් පමණක්ම අපගේ ඇදහිලිවන්ත ජීවිතය සාර්ථකව ගෙනයෑමට අවශ්‍ය කරන ශක්තිය සහ කැපවීම අප හට ලැබේ. වසරේ දෙසැම්බර් මාසය පුරා කුඩා බිළිදෙකු හැටියටත්, මාර්තු-අප්‍රේල් මාසවලදී කුරුසිය මත මැරුණු දුක්ඛිත මනුෂ්‍යයෙකු හැටියටත් යේසුස්වහන්සේ ගැන සිතීමට බොහෝ දෙනා පුරුදු වී සිටිති. එහෙත් වර්ථමාන යේසුස් වහන්සේ ඒ සියලු ස්වරූපයන්ට වඩා වෙනස්ය. උන්වහන්සේ තේජස සහ ගෞරවය නැමති ඔටුන්න පැළඳගෙන සිටින රජ්ජුරුවන්වහන්සේය. අපගේ ආත්මික ජීවිතයට පිබිදීමක් ලබා ගැනීමට නම් අප විසින්ද යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශ්‍රේෂ්ඨ මහිමය දැන හඳුනාගත යුතුය.

ISBN 978-955-51101-4-3

# එළිදරව් පොතෙන් හෙළිදරව් වන යේසුස්වහන්සේගේ මහිමය

**ISBN** 978-955-51101-4-3

නෙවිල් ජයසුන්දර

විස්ඩම් පබ්ලිෂර්ස් විසින් මුද්‍රණය කරන ලදී.
අංක 07, විවේකානන්ද පාර, වැල්ලවත්ත

# හැඳින්වීම

ශුද්ධවූ බයිබලයේ පොත් 66 අතුරින් එළිදරව් පොත වර්ථමානයේ බොහෝ කිතුණුවන්ගේ වැඩිම අවධානයට ලක් වූ පොත ලෙස සැලකිය හැකිය. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දෙවැනි පැමිණීමටත් පීඩා කාලයට සහ අවසන් කාලයටත් අදල වූ කරුණු එම පොතෙහි අඩංගු වී තිබීම නිසා එම කරුණු පිළිබඳව උනන්දුවක් දක්වන කිතුණු ඇදහිලිවතුන් එළිදරව් පොත අධ්‍යයනය කිරීමට පෙළඹෙති.

ක්‍රි.ව 95 දී පමණ යොහන් ප්‍රේරිත තුමා විසින් මෙම එළිදරව් පොත පත්මොස් නම් දූපතේදී රචනා කරන ලදී. ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඇදහූ නිසා සහ උන්වහන්සේගේ ශුභාරංචිය දේශනා කිරීම නැමති "වරද" නිසා පත්මොස් නම් දූපතට පිටමං කරනු ලැබ සිටි ඔහුට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ විසින් එළිදරව් කරදුන් කරුණු රචනා කිරීමෙන් එළිදරව් පොත බිහිවුණි. "මෙතෙක් සැඟවී තිබුණු කරුණු එළිදරව් කිරීම" එම පොත හැඳින්වෙන නමෙහි අර්ථයයි. **යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඇත්තාවූ අපගේ මිදීමත්, උන්වහන්සේගේ සභාවෙහි ස්වරූපයත්, යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීමත්, මහත් දුක්ඛිත සිදුවීම් සහිත පීඩා කාලයත්, විරුද්ධ ක්‍රිස්තුස් යයි අප හඳුන්වන මෘගයා නම් වූ ලෝක නායකයාත්, දෙවියන්වහන්සේගේ විනිශ්චයත්, අවුරුදු දහසේ ක්‍රිස්තුස්වහන්සේගේ රාජ්‍යයත්, සදකාලයත්, ස්වර්ගයේ මහිමය සහ නිරයේ කාලකණ්ණි බවත්** පිළිබඳව අසභාය විස්තරයක් එළිදරව් පොතෙහි අඩංගු වන නමුදු එම පොතෙහි ප්‍රධාන තේමාව වී ඇත්තේ **ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සහ උන්වහන්සේගේ අති ශ්‍රේෂ්ඨ මහිමයයි.** ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මුළු පොළොවෙහි අග රජු බව මුළු ලොවට දැන ගැනීමට සැලසෙන අයුරුත් මේ පොළොවේ මිනිස්

ආධිපත්‍ය අවසන් වී යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ආධිපත්‍ය ස්ථාපිත වන අයුරුත් එම පොතෙහි විස්තර කරනු ලබයි. ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සැබෑ අනන්‍යතාවය පිළිබඳව මනසෙහි ඇති දුර්වාබෝධයන් දුරුකර ගැනීමට නම් සෑම කිතුණු ඇදහිලිවන්තයෙකුම එළිදරව් පොත කියවා අධ්‍යයනය කල යුතුය. එහි සෑම පරිච්ජේදයකින්ම එළිදරව් වනුයේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මහිමශ්‍රීයයි. සෙසු කරුණු එම මහිමශ්‍රීය ඉස්මතු කර පෙන්වීමට ඉවහල් වනවා මිස ඒවා එම පොතෙහි තේමාව නොවේ.

පළමු ශත වර්ෂයේ සිටි යුදෙව් ජාතික කිතුණු ඇදහිලිවන්තයින් මුලදී ඉමහත් ප්‍රීතියකින් සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඇති ගැලවීමෙහි ප්‍රමෝදයට පත් වෙමින් ජීවත් වුවද කල්ගත වෙත්ම නොඇදහිලිකාර යුදෙව්වරුන්ගෙන් පැමිණි පීඩා සහ ඇදහිල්ලට එල්ල වූ බාධා හේතුවෙන් දුර්වල තත්වයකට පත්වෙමින් සිටියහ. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අනුගමනය කිරීම නවතා ඇදහිල්ලෙන් ඉවතට හැරී යන්නට ආසන්න තත්වයකට ඔව්හු වැඩි දෙනා පත්වී සිටියහ. වාම් ඇදහිල්ලේ මාර්ගයේ ගමන් කරනු වෙනුවට, දේවමාළිගාව, විශේෂ ඇඳුම් ආයිත්තමින් සැරසුනු පූජකයින්, විවිධ මංගල්‍ය සහ පුද පූජාවලින් ආකර්ශණීය වූ පැරණි ක්‍රමයට යලි හැරී යන්නට ඔවුන්ට තිබූ පරීක්ෂාව විශාලය. අලංකාර තිර දැමූ දේව මාළිගාව වෙනුවට ඔවුනට දැන් තිබුණේ රැස්වෙන නිවසක් හෝ ශාලවක්ය. එවන් අවදියක හෙබ්‍රෙව් ඇදහිලිවතුන් වෙත යොමු කරනු ලැබූ ලිපියකි හෙබ්‍රෙව් යැවුම් පත්‍රය. එහි පහත අද්වීතීය ප්‍රකාශනය කිරීමෙන් එම කතෘතුමා යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සැබෑ අනන්‍යතාවය සහ වර්ථමාන තේජවත් තත්වය වෙත සැමගේ අවධානය යොමු කලේය. **"දෙවියන්වහන්සේගේ කරුණාවෙන් සියල්ලන් උදෙසා මරණය විඳින පිණිස දේවදූතයන්ට වඩා මදක් පහත්කරනු ලැබුවාවූ උන්වහන්සේ, එනම් යේසුස්වහන්සේ, මරණය වින්ද නිසා තේජස හා ගෞරවය**

**නමැති ඔටුන්න පැළඳගන සිටින බව අපට පෙනේ** “ (හෙබ්‍රෙව් 2:9). “යේසුස්වහන්සේ තේජස හා ගෞරවය නමැති ඔටුන්න පැළඳගන සිටින බව අපට පෙනේ “ යන ප්‍රකාශනයට සිතට එකඟව ආමෙන් යයි පැවසීමට ඔබට හැකිද? මෙය කිතුණු ඇදහිලිවන්තයාගේ ප්‍රධානම අවශ්‍යතාවය හැටියට මම දකිමි. යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ වර්ථමාන තේජස ඇදහිල්ලේ නෙතින් දැකීමෙන් පමණක්ම අපගේ ඇදහිලිවන්ත ජීවිතය සාර්ථකව ගෙනයෑමට අවශ්‍ය කරන කැපවීම අප හට ලැබේ. වසරේ දෙසැම්බර් මාසය පුරා කුඩා බිළිඳෙකු හැටියටත්, මාර්තු අප්‍රියෙල් මාසවලදී කුරුසිය මත මැරුණු දුක්ඛිත මනුෂ්‍යයෙකු හැටියටත් යේසුස්වහන්සේ ගැන සිතීමට බොහෝ දෙනා පුරුදු වී සිටිති. එහෙත් වර්ථමාන යේසුස්වහන්සේ ඒ සියලු ස්වරූපයන්ට වඩා වෙනස්ය. උන්වහන්සේ තේජස සහ ගෞරවය නැමති ඔටුන්න පැළඳගෙන සිටින රජ්ජුරුවන්වහන්සේය. හෙබ්‍රෙව්වරුන්ට යැවුම් පත්‍රය ලියන ලද කතෘතුමා විසින් යේසුස්වහන්සේගේ සැබෑ ශ්‍රේෂ්ඨත්වය සහ මහිමය එළිදරව් කර දීම මගින් එවකට සිටි යුදෙව් ඇදහිලිවතුන්ගේ ආත්මික ජීවිතය යලි පිබිදවීය. අපගේ ආත්මික ජීවිතයටත් එවැනිම පිබිදීමක් ලබා ගැනීමට නම් අප විසින්ද යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ශ්‍රේෂ්ඨ මහිමය දැන හඳුනාගත යුතුය.

# එළිදරව් පොතෙන් හෙළිදරව් වන යේසුස්වහන්සේගේ සත් වැදෑරුම් මහිමය

"උන්වහන්සේ රජවරුන්ගේ රජය,
ස්වාමීවරුන්ගේ ස්වාමීන්වහන්සේය"
(එළිදරව් 19:16).

ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මහිමය අවබෝධ කරගැනීමේ අරමුණෙන් යුතුව එළිදරව් පොත කියෙවුවහොත් එතුලින් එළිදරව් වන උන්වහන්සේගේ මහිමය දැක ගැනීම එතරම් අපහසු නොවේ. එම මහිමය යේසුස්වහන්සේගේ සත් වැදෑරුම් මහිමය ලෙස විස්තර කළ හැකිය.

# 1. ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මළවුන්ගෙන් නැවත නැගිටීමේ මහිමය
## එළිදරව් 1 වෙනි පරිච්ඡේදය

යේසුස්වහන්සේගේ මහිමය පිළිබඳව ශුද්ධවූ බයිබලයේ අන් කිසිදු ස්ථානයක හමු නොවන ආකාරයේ විස්තරයක් එළිදරව් පළමුවන පරිච්ඡේදයේ සඳහන් වේ. පත්මොස් දිවයිනෙහි සිරගතව තනිව සිටි යොහන් තුමාට, තමා පිටුපසින් අමතන කටහඬක් ඇසුණි (1:11). එම කටහඬ කිමෙක්දැයි බලන්නට ආපසු හැරුණු ඔහු දුටු දර්ශනය අතිශයින් විශ්මය ජනකය. **"එකල මා සමඟ කථාකල ශබ්දය කිමෙක්දැයි බලන්ට හැරුණෙමි. එසේ හැරුණු කල, රන් පහන් රුක් සතක්ද, ඒ පහන් රුක් මැද තමන්ගේ පාදය දක්වා වස්ත්‍රයක් පැළඳ රන් පටියකින් ළය බැඳගෙන සිටි මනුෂ්‍ය පුත්‍රයෙක් වැනිවූ කෙනෙක් ද දුටිමි. උන්වහන්සේගේ හිසද හිසකෙස්ද සුදු ලොම් සහ හිම මෙන් සුදුය. උන්වහන්සේගේ ඇස් ගිනිදැල්ලක් හා සමානය, උන්වහන්සේගේ පාද උදුනක ගිනියම් කල පිත්තල මෙන්ය. උන්වහන්සේගේ ශබ්දය බොහෝ ජල ඝෝෂාවක ශබ්දය මෙන්ය. උන්වහන්සේ ස්වකීය දකුණතෙහි තාරකා සතක් ඇතුව සිටිසේක. උන්වහන්සේගේ මුඛයෙන් දෙමුවහත් තියුණු කඩුවක් නික්මුණේය. උන්වහන්සේගේ මුහුණ තදින් බබළන සූර්යයා මෙන්ය" (එළිදරව් 1:12-16).**

මෙවැනි අසහාය දර්ශනයක් දුටු යොහන් තුමා ඊට දැක්වූ ප්‍රතිචාරය කුමක්ද? **"මම උන්වහන්සේ දුටු විට මළ කෙනෙකු මෙන් උන්වහන්සේගේ පාමුල වැටුණෙමි"**(1:17). මේ යොහන් තුමා යේසුස්වහන්සේ ප්‍රේමකළ ගෝලයා යන විරුදවලිය ලැබූ තැනැත්තාය. අවසාන රාත්‍රි කෑම මේසයේ යේසුස්වහන්සේගේ ළයට හාන්සි වී

සිටි ගෝලයාද ඔහුය. තම සමීප සගයෙකු ලෙස යේසුස්වහන්සේ ඇසුරු කළ යොහන් තුමාට දැන් සිදුවී තිබෙන විපර්යාසය කුමක්ද? උන්වහන්සේගේ ළයට හාන්සි වෙනවා වෙනුවට මළ කෙනෙකුමෙන් පාමුළ වැඳවැටී නමස්කාර කිරීමට හෙතෙම පෙළඹුණී.

මෙහිදී යේසුස්වහන්සේ එළිදරව් වුයේ, තමන්වහන්සේගේ මළවුන්ගෙන් නැවත නැගිටීමේ මහිමයෙන් යුක්තව යයි පැවසිය හැකිය. වර්ථමාන කිතුණු ඇදහිලිවන්තයාට යේසුස්වහන්සේගේ මෙම මහිමය පිළිබඳව අලුත් එළිදරව් වීමක් අවශ්‍ය කර තිබේ. යේසුස්වහන්සේ තවදුරටත් කුඩා බිළිඳෙකුවත්, දුක්විඳින මිනිසෙකුවත් නොව තේජෝ මහිමයෙන් යුතු ස්වාමීන්වහන්සේය. මෙහිදී යේසුස්වහන්සේගේ ස්වරූපය ගැනත් උන්වහන්සේගේ වස්ත්‍රවල අකාරය ගැනත් යොහන් තුමා දීර්ඝ විස්තරයක් කර තිබේ. ඒ කරුණු එකින් එක සිතා බැලුවහොත් යේසුස්වහන්සේගේ මළවුන්ගෙන් නැගිටීමේ මහිමය ගැන යම් අදහස් මතුකර ගත හැක. දිගු වස්ත්‍රය, උන්වහන්සේගේ ස්වාමීකත්වය ගැනත්, සුදු හිසකේ, උන්වහන්සේගේ අති මහත් ප්‍රඥාව ගැනත් යනාදී වශයෙන් උන්වහන්සේගේ මහිමයේ විවිධ පැතිකඩ ගැන අපට තේරුම් ගැනීමට හැකිය.

sv|¸v| _ysśvhn_s_g ÓLvĥ_gn n[gÕ_¹ ÓhÓy s|r0H _ls _Ó_sy.

1. p|qy qkv| දිගු vsey (1:13) - _ysśvhn_s_g sv|¸k`vy.

2. p|qy qkv| දිගු vsey (1:13) - _ysśvhn_s_g p| jk`vy.

4. hŝ sÁ p[h[_yn යුතුව තිබීම (1:14) - _ysúvhn_s_g èqØkÓ.

5. hŝ _ks sÁ p[h[_yn යුතුව eǒÓ (1:14) - _ysúvhn_s_g aeǒhe pV|v.

6. kt h_â H¢qy Óhe jl සෝෂාවක _Ón ØÓ (1:15) - _ysúvhn_s_g kth_â bly.

7. Ó]húN eqò bbln sÙY| _Ón ØÓ (1:16) - _ysúvhn_s_g cĐe_y pB|vy sh al0k|ry.

unvhn_s_g svr{py pĽbXv AÓ èqØ lǜ[×lò_k|t_s a[eǒ අනෙකුත් ×ser ihe kr[Núhe yt_e _g|núkl h[kǜ.

## 2. අළුත් ගිවිසුම් සභාව මධ්‍යයෙහි වන ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මහිමය

### එළිදරව් 2 සහ 3 පරිච්ජේද

එළිදරව් 2 සහ 3 වැනි පරිච්ජේදවල සඳහන් වනුයේ යේසුස්වහන්සේ විසින් සභා 7 කට යවන ලද ලිපි සතකි. එවකට කුඩා ආසියාව නමින් හැඳින්වූ (වර්ථමාන තුර්කිය) ප්‍රදේශයෙහි නගර කිහිපයක තිබූ ඇදහිලිවන්ත සභා හතකට යේසුස්වහන්සේ විසින් යවනු ලැබූ පණිවිඩ 7ක් මෙහි සඳහන් වේ. එම නගර හත එපීස, ස්මර්ණය, පර්ගමම්, තියාතිරාව, සර්දිස්, පිලදෙල්පියාව, සහ ලවෝදික නම් වේ. පත්මොස් දූපතෙහි සිරගත වී සිටි යොහන් තුමා කරණ‍ෙ කාටගෙන මෙම නගර සතෙහි පිහිටි ඇදහිලිවන්ත සභා සතට යේසුස්වහන්සේ විසින් යවනු ලැබුවාවූ පණිවිඩයෙහි සඳහන් කරුණු යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මහිමයෙහි තවත් පැති කඩක් එළිදරව් කෙරේ යැයි කිව හැකිය.

මෙම සභා එකිනෙකට යේසුස්වහන්සේ එළිදරව් වන ආකාරය එම එක එක ලිපිය ආරම්භ වන වචන කිහිපයෙන් දැනගත හැකිය. එසේ යේසුස්වහන්සේ එක එක සභාවට එළිදරව් වන ආකාරය උන්වහන්සේගේ සත්ප්‍රකාරවූ මහිමය ප්‍රකාශ කරයි. එය අලුත් ගිවිසුම් සභාව මධ්‍යයෙහි වන උන්වහන්සේගේ සත්ප්‍රකාර මහිමය ලෙස නම් කල හැක. වර්ථමානයේද සෑම සභාවකම ඇති ප්‍රධානම අවශ්‍යතාවය නම් ක්‍රිස්තුස්වහන්සේගේ මහිමය දැන හඳුනා ගැනීමයි.

එළිදරව් 2 සහ 3 පරිච්ජේදවල හෙළිදරව් වන "සභාව මධ්‍යයෙහි පෙනෙන යේසුස්වහන්සේගේ මහිමය" පහත සඳහන් ආකාරයට ලුහුඩින් සඳහන් කල හැක.

1. “තමන් දකුණතෙහි තාරකා සත දරන්නාවූ රන් පහන් රුක් සත මැද සක්මන් කරන්නාවූ තැනැන්වහන්සේ” (එළිදරව් 2:1)

**ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ස්වාමීකත්වය**

2. “පළමුවැනියද අන්තිමයද වන මැරී ජීවත් වුනාවූ තැනැන්වහන්සේ” (එළිදරව් 2:8).

**ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අසහාය බව**

3. “දෙමුහත් තියුණු කඩුව ඇත්තාවූ තැනැන්වහන්සේ” (එළිදරව් 2:11).

**ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ වචනය**

4. “ගිනි දැල්ලක් වැනි ඇස්ද දිලිහෙන පිත්තල වැනි පාදයන්ද ඇත්තාවූ ස්වාමීන්වහන්සේ” (එළිදරව් 2:18).

**ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ විනිශ්චය**

5. දෙවියන්වහන්සේගේ ආත්මයාණන් සත්දෙනාද තාරකා සතද ඇත්තාවූ තැනැන්වහන්සේ” (එළිදරව් 3:1).

**ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ආත්මයාණෝ**

6. ශුද්ධවූ සැබෑවූ දාවිත්ගේ යතුර ඇත්තාවූ කිසිවෙකු ෆ

නාපියන ලෙස අරින්නාවූ කිසිවෙකු නාරින ලෙස පියන්නාවූ තැනැන්වහන්සේ" (එළිදරව් 3:7).

**ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අධිකාරීත්වය**

7. "ආමෙන් නැමැත්තාවූ විශ්වාසවූ සැබෑ සාක්ෂිකාරවූ දෙවියන්වහන්සේගේ මැවිල්ලේ මුලද වූ තැනැන්වහන්සේ" (එළිදරව් 3:14).

**ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ පරම ශ්‍රේෂ්ඨත්වය**

ඉහත සඳහන් ආකාරයට වන ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සත්ප්‍රකාර මහිමය තේරුම් ගැනීම වර්ථමාන කිතුණු සභාවේ අති මහත් අවශ්‍යතාවයයි.

# 3. ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ස්වර්ගීක මහිමය
## එළිදරව් 4 සහ 5 පරිච්ඡේද

එළිදරව් 4 සහ 5 වෙනි පරිච්ඡේද අප ගෙන යනුයේ ස්වර්ගීක දර්ශණයක් වෙතටයි. ස්වර්ගය සහ එහි තිබෙන දෑ පිළිබඳව ශුද්ධ ලියවිල්ලෙහි ඇති දීර්ඝතම විස්තරය තිබෙන්නේ මෙම පරිච්ඡේද දෙකෙහිය. ස්වර්ගය පිළිබඳව ඇති හෙළිදරව් කිරීම තුල වඩාම කැපී පෙනෙන කරුණ නම් ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මහිමයි. යේසුස්වහන්සේගේ වර්ථමාන ස්වභාවය නම් දැන් උන්වහන්සේ ස්වර්ගයෙහි සිටින ස්වභාවයයි. අපටත් එදා යොහන්ට මෙන් ස්වර්ගයට එබී බලන්නට අවකාශයක් ලැබුනේ වී නම් යේසුස්වහන්සේ "තේජස හා ගෞරවය නැමති ඔටුන්න පැළඳගෙන සිටින බව" දැක ගත හැකි වනු ඇත. එළිදරව් 4 සහ 5 පරිච්ඡේදවලින් හෙළිදරව් වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ස්වර්ගීක මහිමය සත් ආකාර ලෙස පහත සඳහන් අයුරින් ලුහුඬින් දැක්විය හැකිය.

1. "එවිට ස්වර්ගයේ සිංහාසනයක් තිබුනේය ඒ සිංහාසනයෙහි එක්කෙනෙක් වැඩහුන්සේක" (එළිදරව් 4:2).

**ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සිංහාසනයේ මහිමය**

2. "එහි වැඩහුන් තැනැත්වහන්සේ පෙනීමෙන් සූර්යකාන්ති සහ ලෝහිතාංක මැණික් වලට සමානව සිටි සේක" (එළිදරව් 4:3).

**ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ස්වරූපයේ මහිමය.**

3. "සිංහාසනය ඉදිරියෙහි ගිණි පහන් සතක් දැල්වෙමින් තිබුනේය. ඒවා නම් දෙවියන්වහන්සේගේ "ආත්මයාණෝ සත් දෙනාය" (එළිදරව් 4:5).

**ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ආත්මයාණන්ගේ මහිමය.**

4. "සිංහාසනය මධ්‍යයෙහිත් සිංහාසනය අවටත් ඉස්සරහින්ද පස්සෙන්ද ඇස්වලින් පිරුණාවූ ජීවමාන සත්වයන් සතර දෙනෙක් සිටියෝය. පළමුවෙනි සත්වයා සිංහයෙකුට සමානය, දෙවැනි සත්වයා වස්සකුට සමානය, තුන්වැනි සත්වයාට මනුෂ්‍යයෙකුගේ මෙන් මුහුණක් තිබුනේය. සතරවෙනි සත්වයා පියාසර කරන රාජාලියෙකුට සමානය" (එළිදරව් 4:6,7).

**ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මාංශවත් වීමේ මහිමය.**

5. "අපගේ ස්වාමීන්වහන්ස, අපගේ දෙවියන්වහන්ස, ඔබ ප්‍රශංසාවත් ගෞරවයත් බලයත් ලබන්ට වටින තැනැන්වහන්සේය. මක්නිසාද ඔබ සියලු දේ මැවූ සේක. ඔබගේ කැමැත්ත නිසා ඒවා තිබුනේය, ඒවා මවන ලද්දේ ය" (එළිදරව් 4:11).

**ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ බලපරාක්‍රමයේ**

**මහිමය.**

6. “නොහඬන්න මෙන්න පොත සහ එයි මුද්‍රා සත දිග හරින ලෙස යුදගේ ගෝත්‍රයෙන් වූ සිංහයාද දාවිත්ගේ මුලද වූ තැනැත්වහන්සේ ජයගත් සේක” (එළිදරව් 5:5).

**ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ජයග්‍රහණයේ මහිමය.**

7. “ඔහු කථාකොට මරණු ලැබූ බැටළු පැටවාණෝ බලයත් ධනයත් ප්‍රඥාවත් පරාක්‍රමයත් ගෞරවයත් තේජසත් ප්‍රශංසාවත් ලබන්ට වටින තැනැන්වහන්සේ යැයි මහත් හඬින් කීවෝය” (එළිදරව් 5:12).

**ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මහිමයේ මහිමය.**

# 4. මහා පීඩා තුල ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මහිමය

## එළිදරව් 6:1-19:10

එළිදරව් 6 වෙනි පරිච්ඡේදයෙන් ආරම්භ වන ශුද්ධ ලියවිලි කොටස ලෝකවාසී ජනතාවට මුහුණ දීමට සිදුවන අති භයංකර සිදුවීම් මාලාවක් විස්තර කරයි. එම සිදුවීම් මාලාව ස්වර්ගයෙහි වැඩ වසන දෙවියන්වහන්සේ විසින් මෙලොව පිටට නියම කරනු ලබන විනිශ්චයන් හැටියට සඳහන් කර තිබේ. මෙය සිදුවන කාල වකවානුව පීඩාකාලය හෝ මහා පීඩා කාලය ලෙස පොදුවේ හඳුන්වනු ලබයි. වර්ථමාන ලෝකවාසී ජනතාවගෙන් වැඩිම ප්‍රතිශතයක් දිවි ගෙවන්නේ දෙවියන්වහන්සේගෙන් ස්වාධීනවයි. ඔවුන් දෙවියන්වහන්සේව විශ්වාස කරන්නේවත් උන්වහන්සේට ගෞරව දක්වන්නේවත් නැත. එහෙත් දෙවියන්වහන්සේ කෙරෙන් පැමිණෙන විනිශ්චයන් මෙලොව පිට පතිත වීම ආරම්භවූ විට දෙවියන්වහන්සේගේ මහිමය පිළිබඳව මිනිස් සංහතියට වැටහී යනු ඇත. එම විනිශ්චයන් අති භයංකර ඒවා බව එළිදරව් 6:1-19:10 හි ඇති ශුද්ධ ලියවිලි කියැවීමෙන් පහසුවෙන් තේරුම්ගත හැක. සාගත, වසංගත යුද්ධ, කෝලහාල, ඉර සඳ අඳුරු වීම, භූමිකම්පා, සහ වතුර ලේ බවට හැරීම වැනි සිදුවීම් මිනිසා අන්ත අසරණ භාවයකට ඇද දමනු ඇත.

එහෙත් මෙම කාලයට මුහුණ දීමට සැබෑ කිතුණු ඇදහිලිවන්තයාට සිදු නොවනු ඇත. මන්ද මෙම කාල පරිච්ඡේදයේ ආරම්භයට පෙර වළාකුල් මතට පැමිණෙන යේසුස්වහන්සේ, උන්වහන්සේගේ දරුවන් ස්වර්ගයට ඇද ගනු ලබන නිසාය (1 තෙසලෝනික 4:13-17). ඉහත කී විනාශකාරී පීඩාකාලය තුලින් සිදුවන එක් ප්‍රධාන ප්‍රතිඵලයක්

නම් ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මහිමය ඉස්මතු වීමයි. ඒ පිළිබඳව ගීතාවලිය 110:1 මෙසේ ලියා තිබේ. "**ස්වාමීන්වහන්සේ මාගේ ස්වාමීන්ට කථා කොට මා විසින් නුඹේ සතුරන් නුඹගේ පා පුටුව කරන තෙක් මාගේ දකුණු පැත්තෙහි හිඳින්නැයි කීසේක**" මෙම බයිබල් පදය සත් වතාවක් අලුත් ගිවිසුමෙහි ගෙනහැර දක්වා තිබේ. පීඩා කාලය තුලදී සැබවින්ම ඉටුවන්නේ මෙම දේව වචනයයි. ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා බවත් පොළොව විනිශ්චයට යටත් කිරීමේ බලය උන්වහන්සේට තිබෙන බවත් ඒ කාලය තුලදී සනාථ වනු ඇත. මෙය පීඩා කාලය තුල එළිදරව් වන ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මහිමය යැයි නම් කළ හැකිය.

ඒ මහිමය අර්ථවත් වන යේසුස්වහන්සේගේ විවිධ පැතිකඩ ෙ හළිදරව් වන අවස්ථා කිහිපයක් පහත ලැයිස්තු ගත කර ඇත.

1. විනිශ්වයන් පොළව මතට එවන බැටළුපැටවාණෝ - 6:1

2. ශුද්ධවන්තයන්ගේ යාච්ඤා ගැන මැදහත්කම් කරන උත්තම පූජක දේවදූතයාණෝ - 8:3

3. අග්‍ර විනිශ්චයකාර දේවදූතයාණෝ - 10:1-3

4. ජාතීන් යදන්ඩකින් ආණ්ඩුකරන පිරිමි දරුවාණෝ - 12:5

5. මිදීමේ කතෘ වන බැටළු පැටවාණෝ - 14:1-4

6. පොළවේ අස්වැන්න රැස්කරන මනුෂ්‍ය පුත්‍රයාණෝ - 14:14-16

7. සභාවේ මනාලයා වන බැටළුපැටවාණෝ - 19:7

## පීඩා කාලයේ අම්හිරි තොරතුරු

“ලෝකයේ පටන්ගැන්මේ සිට මේ දක්වා නූණාවූ, මතු කොයිකල ලකවත් නොවන්නාවූ මහත් පීඩාවක් ඒ කාලයෙහි වන්නේය” (මතෙව් 24:21).

## පීඩා පැමිණෙන පියවර හතර

1. මුද්‍රාසත කැඩීම (6 පරිච්ඡේදය)
2. හොරණෑ සත පිඹීම (8,9)
3. ගර්ජනා සත ශබ්ද පැවැත්වීම (10:4)
4. උදහසේ භාජන 7 වැගිරවීම (15,16)

## පීඩා පියවර හතර අතරතුර

1. මුද්‍රනු ලබන අය මුද්‍රා කිරීම (7 පරිච්ඡේදය)
2. යොහන් සහ කුඩා පොත (10:8-11)
3. සාක්ෂිකරුවන් දෙදෙනා (11)
4. ඉශ්‍රායෙල් නම් ස්ත්‍රිය - (12:1-6)
5. ස්වර්ගයේ යුද්ධය - (12:7-12)
6. මෘගයන් දෙදෙනා - (13)
7. දේවදූතයන් තිදෙනාගේ ප්‍රකාශන - (14:6-11)
8. පොළවේ අස්වැන්න - (14:14-16)
9. මිදි පැස - (14:17-20)
10. අශුද්ධ ත්‍රිත්වය සහ හර්මගෙදෙන්- (16:3-16/ 19:17-21)
11. ආගමික බබිලෝනියේ අවසානය - (17:1-18)
12. දේශපාලනමය, වානිජ්‍යමය බබිලෝනියේ අවසානය -

# 5. ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ එළිදරව් වීමේදී උන්වහන්සේගේ මහිමය
## එළිදරව් 19:11-16

ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ තේජෝ මහිමය සියැසින් දැක ගැනීමට මිනිස් සංහතියට අවස්ථාව උදා වන්නේ උන්වහන්සේගේ දෙවන පැමිණීමේ අවස්ථාවේදීය. එනම් මිහිපිට රජකම් කිරීම පිණිස පොලොවට පැමිණෙන අවස්ථාවේදීය. එයට යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ එළිදරව් වීම යයි කියනු ලැබේ. ඇත්තෙන්ම එය යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ දෙවන පැමිණීමේ දෙවැනි කොටස වේ. උන්වහන්සේගේ දෙවන පැමිණීමේ පලමු වන කොටස නම් තම ඇදහිලිවතුන් ස්වර්ගයට ගෙන යෑම පිණිස වළාකුල් මතට පැමිණීමයි. එය රහසිගතව සිදුවන්නකි. එවිට යේසුස්වහන්සේව දකින්නේ වළාකුල්වලින් අහසට ඇදගනු ලබන ඇදහිලිවතුන් පමණි. ඒ පීඩා කාලය ආරම්භ වීමට පෙරදීය. එහෙත් උන්වහන්සේගේ දෙවන පැමිණීමේ දෙවන කොටස වන යේසුස්වහන්සේගේ එළිදරව් වීම සියලු ලෝකවාසී ජනතාව දකිනු ඇත. **"බලපල්ලා උන්වහන්සේ වළාකුල්වලින් එනසේක. සියලු ඇස්ද උන්වහන්සේට ඇන්න අයද උන්වහන්සේව දකින්නේය"**
**(එළිදරව් 1:7).**

ස්වාමීවූ යේසුස්වහන්සේගේ එළිදරව් වීමෙහි මහිමය පිළිබඳව ඉතා කෙටි සඳහනක් එළිදරව් 19:11-16 දක්වා ඇති දේව වචන කොටසෙහි සඳහන්ව තිබේ. එය කියා නිම කල නොහැකි මහිමයක් වන නමුදු එම දේව වචන කොටසෙහි උන්වහන්සේ හඳුන්වන විවිධ නාම මගින් ඉතා සුළු පමණින් හෝ ඒ මහිමය අපට හඳුනාගත හැකි වෙයි.

**<u>ක්‍රිස්තුස්වහන්සේගේ එළිදරව් වීමේදී උන්වහන්සේ හැඳින්වෙන නාම</u>**

1. විශ්වාස නම් වූ තැනැත්වහන්සේ - එළිදරව් 19:11

2. සැබෑව නම් වූ තැනැත්වහන්සේ - එළිදරව් 19:11

3. කිසිවෙකු නොදන්නාවූ නමක් ඇත්තාවූ තැනැත්වහන්සේ - එළිදරව් 19:12

4. දෙවියන්වහන්සේගේ වාක්‍යයාණෝ යයි නම් ලැබූ තැනැත්වහන්සේ - එළිදරව් 19:13

5. රජවරුන්ගේ රජය, ස්වාමිවරුන්ගේ ස්වාමීන්වහන්සේ යයි නම් ලැබූ තැනැත්වහන්සේ - එළිදරව් 19:16

ඉහත මෙම නාම එකිනෙක මගින් උන්වහන්සේගේ මහිමයේ විවිධ පැතිකඩ එළිදරව් කරයි. එයට ලෝකවාසී ජනතාවගේ ප්‍රතිචාරය පිලිප්පි 2:9-11 දක්වා සඳහන් කොට තිබේ. **"එබැවින් දෙවියන්වහන්සේ උන්වහන්සේව ඉතා උසස් කොට, සියලු නාමවලට වඩා උසස් නාමය උන්වහන්සේට දුන්සේක. එසේ කලේ, පොළොෙ වහිද පොළොව යටද සියල්ලන් යේසුස් යන නාමයෙන් දණ නමන පිණිසත්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ස්වාමීන්වහන්සේ බව පියවූ**

# 6. සහස්‍ර රාජ්‍ය කාලය තුල ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මහිමය

## එළිදරව් 20:1-6 / එළිදරව් 21:9-22:5

මහා පීඩා කාලය අවසානයේදී ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මෙලොවට පැමිණීමෙන් පසු යෙරුසලමේ සිට වසර දහසක කාලයක් මිහිපිට රජකම් කරන බව ඉහත දේව වචන කොටස කියැවීමෙන් අපට තේරුම් ගත හැක. මිහිපිට මනුෂ්‍ය ඉතිහාසය අවසානයට පැමිණෙන්නේ මෙම සහස්‍ර - වර්ෂ රාජ්‍ය කාලයට අනතුරුවය. මෙම රාජ්‍යකාලය පිළිබඳව පරණ ගිවිසුම් සහ අලුත් ගිවිසුම් ශුද්ධ ලියවිල්ලෙහි ස්ථාන ගණනාවකම සඳහන්ව තිබේ.

ස්වාමීවූ යේසුස්වහන්සේ මුළු පොළොවට රජව සිටින විටදී ලෝකයෙහි පවතින ස්වභාවය පිළිබඳව එක් විස්තර කර දීමක් මෙසේය. **"ධර්මිෂ්ඨකම උන්වහන්සේගේ ඉඟපටියද විශ්වාසකම උන්වහන්සේගේ බඳපටියද වන්නේය. වෘකයා බැටළුපැටවා සමග වාසයකරන්නේය, දිවියාද එළුපැටියා සමග ලගින්නේය, වස්සාද තරුණ සිංහයාද තර සතාද එක්ව සිටින්නේය. කුඩා දරුවෙක් උන් ගෙනයන්නේය. එළදෙනත් වලසාත් එක්ව තෘණ කන්නෝය, උන්ගේ පැටවුන්ද එක්ව ලගින්නෝය. සිංහයා හරකා මෙන් පිදුරු කන්නේය. කිරි දරුවා නාගයාගේ තුඹස පිට සෙල්ලම් කරන්නේය, කිරිවැරූ දරුවා පොළඟාගේ ගුල පිට තමාගේ අත තබන්නේය. මාගේ ශුද්ධ කන්දේ සීමා තුළෙහි කිසි අනතුරු කිරීමක්වත් විනාශකිරීමක්වත් නොවන්නේය. මක්නිසාද ජලයෙන් මුහුද වැසී තිබෙන්නාක්මෙන්, ස්වාමීන්වහන්සේ ගැන දැනගැන්මෙන් පොළොව පිරියන්නේය" (යෙසායා 11:5-9).** එම කාලය තුල ලෝකයෙහි සංගත හෝ වසංගත නැත. භූමිකම්පා හෝ ස්වභාවික ව්‍යසනයන් නැත. ජාතිහු තවත්

යුද්ධය ඉගෙනගන්නේවත්, යුද්ධ කරන්නේවත් නැත. සහශ්‍ර රාජ්‍ය කාලය තුළ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මහිමය සියලු ලෝකවාසී ජනතාවට දැක ගැනීමට හැකි වනු ඇත. එය ඇසට පෙනෙන දිලිසෙන මහිමයකි. සමාන්‍ය මනුෂ්‍යයෙකුගේ ස්වරූපයෙන් උන්වහන්සේ බෙත්ලෙහෙමේ ඉපදුණ බිළිදෙකුලෙස පැමිණි පළමු අවස්ථාවේ ලෝකයාට දැකගත හැකි වූයේ “කරුණාවෙන්ද සත්‍යයෙන්ද පූර්ණවූ” උන්වහන්සේගේ චරිතයේ මහිමයයි (යොහන් 1:14). එහෙත් සහශ්‍ර රාජ්‍යයේදී උන්වහන්සේ “රජවරුන්ගේ රජ ලෙස” සියැසින්

## 7. ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සදාකාලික මහිමය

### එළිදරව් 21:1-7

අප ජීවත්වන මෙම ලෝකය පහකරනු ලැබ අලුත් අහසක්ද අලුත් පොළවක්ද දෙවියන්වහන්සේ විසින් මවනු ලබන බව ශුද්ධ බයිබලයේ සඳහන්ව තිබේ. "**අලුත් අහසක්ද අලුත් පොළවක්ද දුටිමි. මක්නිසාද පළමු අහසත් පළමු පොළවත් පහව ගියේය**" (එළිදරව් 21:1). මෙය සිදු වන දින පටන් ආරම්භවන්නේ සදාකාලයයි. එහිදී කාලය ගතවීමක්වත් පරිසරය වෙනස් වීමක්වත් හෝ පරණ වීමක්වත් තවත් සිදු නොවනු ඇත. සදාකාලය පිරී ඉතිරී පවතිනුයේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මහිමයෙනි. "**දෙවියන්වහන්සේගේ තේජසින් නුවර ආලෝක වු බැවින්ද බැටළුබැටවාණන් එහි පහන වන බැවින්ද එහි බැබලීමට සූර්‍ය්‍යයාවත් චන්ද්‍රයාවත් ඕනෑ නැත**" (එළිදරව් 21:23). "**එහි රාත්‍රියක් තවත් නොවන්නේය. පහන් ආලෝකයවත් සූර්‍ය්‍යාලෝකයවත් ඔවුන්ට ඕනෑ නැත. මක්නිසාද ස්වාමී වූ දෙවියන්වහන්සේ ඔවුන්ට ආලෝකය දෙන සේක. ඔව්හු සදාකාලයටම රජකම් කරන්නෝය**" (එළිදරව් 22:5).

දැනට අපට කලහැක්කේ එවන් අපූරු අනාගතයක් ගැන සිහින මැවීම පමණකි. එහෙත් මෙම වචන යථාර්තයක් බවට පත්වන දිනය උදාවනු නොඅනුමානය. එවිට මුළු විශ්වයෙහි ඉස්මතුව පෙනෙන එකම සාධකය වනුයේ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මහිමයයි. උන්වහන්සේගේ කීර්තියයි. කිසියම් හෝ එදිරිවාදී කමක් නොමැතිව උන්වහන්සේ සදාකාලයටම රජකම් කරනු ඇත. උන්වහන්සේගේ සදාකාල මහිමය දැන ගෙන අවසාන කල නොහැකි එකකි. අප එම මහිමය ටිකින් ටික දකිමින් සදාකාලය පුරාම උන්වහන්සේට නමස්කාර කරනු ඇත. එම මහිමයේ අපූරුකම

තේරුම් ගැනීමේ ආරම්භයක් වශයෙන් එළිදරව් 21:1-7 දක්වා කියවා බලන්නට දෙවියන්වහන්සේ අපට අවස්ථාව දී ඇත.

මහා සුදු සිංහාසනයෙන් ආරම්භ වන ක්‍රිස්තුස්වහන්සේගේ සදාකාලික තේජෝමහිමයේ ප්‍රකාශවීම සදාකාලය දක්වා විහිදී යනවා ඇත. එම මහිමය භුක්තිවිඳිමටත් එහි පංගුකාරයන් වීමටත් ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබත් මාත් කැඳවා තිබේ. වර්ථමානයේ පවතින මිනිස් මහිමය එදිනදී දූවිල්ලෙහි හොවනු ලැබේ. ක්‍රීඩා ක්ෂේත්‍රය, සෞන්දර්ය ක්ෂේත්‍රය, දේශපාලන ක්ෂේත්‍රය, අධ්‍යාපනික ක්ෂේත්‍රය තුල කීර්තිය ලබන අය මහා ඉහළින් සලකා ඔවුන් අගය කිරීමට අපි පුරුදු වී සිටිමු. එහෙත් සදාකාලයේදී ඇගයීමට ලක්වනුයේ එක පුද්ගලයෙකු පමණි. ඒ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේයි. සියලු දෙනාගේ සිත සහ මනසද උන්වහන්සේගේ මහිමයෙන් පිරී ඉතිරී යනු ඇත.